අශුභ කර්මස්ථාන නිර්දේශය

තථාගතයන් වහන්සේ වදාළ නිවන් මග ගමන් කරනු රිසි කුලපුත්‍රයන්ට තථාගතයන් වහන්සේ වදාළ භාවනා මාර්ගය නිරවුල්ව පිරිසිදුව පිළිවෙළින් ගෙනහැර දක්වනු පිණිස විශුද්ධිමාර්ගය නම් මේ ථෙරවාදී භාවනා මාර්ගය සම්පාදනය කළ භදන්තාචාර්ය අනුබුද්ධ බුද්ධඝෝෂ මාහිමිපාණන් වහන්සේ කසිණ භාවනා විස්තර වශයෙන් දක්වා තදනන්තරව දශ අශුභය විස්තර ලෙස දක්වන ලදි.

දශ අශුභය නම්

1. උද්ධුමාතක
2. විනීලක
3. විපුබබ්බක
4. විච්ඡිද්දක
5. වික්ඛායිතක
6. වික්ඛිත්තක
7. හතවික්ඛිත්තක
8. ලොහිතක
9. පුවලක
10. අට්ඨික

1. උද්ධුමාතක: සුළං පිරිණු සමක් මෙන් මරණින් පසු අනුක්‍රමයෙන් නැගුණු ඉදිමීමෙන් යුක්ත වූ මළ සිරුර උද්ධමාත ය. උද්ධමාතය ම **උද්ධුමාතක** ය. (ස්වාර්ථයෙහි ක ප්‍රත්‍යය ය.) පිළිකුල් හෙයින් කුත්සිත් වූ උද්ධුමාතය හෝ උද්ධුමාතක ය. (කුත්සිතාර්ථයෙහි ක ප්‍රත්‍යය යි.) මෙයින් ඉදිමී ගිය මළ සිරුරට නමකි.

2. විනීලක: විනීල නම් විපරිහින්න නිල් වර්ණය යි. 'සෙතරත්තෙහි පරිහින්නං විමිස්සිතං නීලං විනීලං' යැයි කී බැවින් සුදු-රත් ආදියෙන් මිශ්‍ර වූ නිල් වර්ණය යි. නැතහොත් 'පුරිමවණ්ණවිපරිණාමභූතං නීලං විනීලං' යැයි කී පරිද්දෙන් පූර්ව වර්ණයෙන් පෙරලි ගිය නිල් වර්ණය යි. විනීලය ම හෝ කුත්සිත විනීල හෝ විනීලක ය. මෙයින් උස් මස් ඇති තන්හි රත් පැහැ වූ, පූයා රැස් වැ සිටි තන්හි සුදු පැහැ වූ, බොහෝ සෙයින් නිල් පැහැති තන්හි නිල් පට පෙරවියාක් බඳු වූ මළ සිරුරට නමකි.

3. විපුබබ්බක: බිඳී පැලී ගිය තන්හි වැහෙන්නා වූ පූයා සැරව ඇත්තේ විපුබ්බ ය. විපුබ්බ ම හෝ කුත්සිත විපුබ්බ හෝ **විපුබ්බක** ය. සැරව වැගිරෙන මළ සිරුරට නමකි.

4. විච්ඡිද්දක: දෙකඩ කොට කැපීමෙන් වෙන් කරන ලද්දේ විච්ඡිද්ද ය. විච්ඡිද්ද ම හෝ පිළිකැල් බැවින් කුත්සිත විච්ඡිද්ද හෝ **විච්ඡිද්දක** ය. මැදින් කපා ලූ මළ සිරුරට නමකි.

5. වික්ඛායිතක: ඔබින් ඔබ නොයෙක් ආකාරයෙන් බලු කැණහිල් ආදීන් විසින් කඩා කන ලද්දේ විකඛායිත ය. වික්ඛායිත ම හෝ කුත්සිත වික්ඛායිත හෝ **වික්ඛායිතක** ය. එබඳු මළ සිරුරට නමකි.

6. වික්ඛිත්තක: බලු කැණහිල් ආදීන් විසින් කන ලදු ව නොයෙක් ආකාරයෙන් ඒ ඒ තැන විසුරුණේ වික්ඛිත්ත ය. වික්ඛිත්ත ම හෝ පිළිකුල් බැවින් කුත්සිත වික්ඛිත්ත හෝ **වික්ඛිත්තක**

ය. අත් අන් තැනෙක පා අන් තැනෙක හිස අන් තැනෙක යැයි මෙසේ ඒ ඒ තැන විසිරී ගිය මළ සිරුරට නමකි.

7. හතවික්ඛිත්තක: අඞ්ග ප්‍රත්‍යඞ්ගයන්හි කාක පාද සේ සිටින්නට ආයුධයෙන් කොටා පෙර කී සේ ඒ ඒ තැන විසුරුවන ලද්දේ හතවික්ඛිත්ත ය. හතවික්ඛිත්ත ම හෝ පිළිකුල් බැවින් කුත්සිත හතවික්ඛිත්ත හෝ **හතවික්ඛිත්තක** ය. එබඳු මළ සිරුරට මේ නමකි.

8. ලෝහිතක: ඔබින් ඔබ ලේ වැගිරෙන්නේ ලෝහිතක ය. 'ලොහිතං කිරති වික්ඛිපති ඉතො චිතො ච පග්ඝරතීති ලොහිතකං' යැයි එහෙයින් කියන ලදි. වැගිරෙන ලෙහෙ වැකුණු මළ සිරුරට නමකි.

9. පුළුවක: පුළුව නම් පණුවෝ ය. පණුවන් වගුරවන්නේ පුළුවක ය. පණුවන් කැල වැගිරෙන මළ සිරුරට නමකි.

10. අට්ඨික: ඇට ම අට්ඨික ය. පිළිකුල් බැවින් කුත්සිත ඇට හෝ අට්ඨික ය. ඇටසැකිල්ල ට ද එක ඇටයකට ද මේ නමකි.

අමු සොහොන් ආදියෙහි දමන ලද මේ උද්ධුමාතකාදී මළසිරුරු අරමුණු කොට උපදනා උග්ගහ-පටිභාග නිමිත්තවලට ද, ඒ නිමිති කොට උපදනා ධ්‍යානයන්ට ද මේ උද්ධුමාතකාදි නාමය ම යෙදේ.

උද්ධුමාතක කර්මස්ථානය

උද්ධුමාතක මළසිරුරෙහි උද්ධුමාතක නිමිති උපදවා උද්ධුමාතක සංඛ්‍යාත ධ්‍යානය වඩනු කැමති යෝගීහු විසින් පඨවි කසිණයෙහි කී පරිද්දෙන් ප්‍රිය ගුරුභාවනීයාදි ගුණ සම්පන්න ආචාර්යයන් කරා එළඹ කමටහන උගත යුතු ය. ඒ යෝගී හට කමටහන් කියා දෙන්නා වූ ආචාර්‍යයන් විසිනුදු මේ සියල්ල කියා දිය යුතු ය.

- අශුභ නිමිත්ත සඳහා යා යුතු සැටි (අශුභයෙහි උග්ගහ නිමිත්ත ගනු පිණිස යන ආකාරය)
- මළකුණ හාත්පස නිමිති සැලකිය යුතු ආකාරය
- එකොළොස් ආකාරයෙන් නිමිති ගතයුතු ආකාරය
- යන එන මඟ සැළකිය යුතු ආකාරය

මෙසේ අර්පණා විධි කෙළවර කොට ඇති සියල්ල කියා දිය යුතු.

ඒ යෝගී විසිනු දු සියල්ල මැනවින් උගෙන නාතිදූරාදි පෙර කී ආකාර සේනාසනයක් කරා එළඹ උද්ධමාතක නිමිත්තයක් සොයමින් විසිය යුතු ය. එසේ වසන්නාහු විසිනු දු අසවල් ගම් දොර හෝ වනමුඛයෙහි හෝ මඟ හෝ පර්වත පාදයෙහි හෝ රුක් මුල හෝ සොහොනෙහි හෝ උද්ධුමාතක ශරීරයක් ඇතැයි කියන්නවුන්ගේ බස් අසා එකෙණෙහි ම පිරුණු නදී ආදියට

නො තොටින් බසින්නකු සේ ලහි ලහියේ නො යා යුතු. ඒ කවර හෙයින් ද යත්, මළ මිනියට සැඩ මෘගයෝ හෝ අමනුෂ්‍යයෝ හෝ අරක් ගෙන සිටිති. එයින් ඔහුගේ ජීවිත විනාශය හෝ වන්නේ ය.

තව ද ගමන් මඟ ගම් දොරින්, නහන තොටින් හෝ කුඹුර අද්දරින් හෝ වූයේ නම් හැල් ගෙවිලිය ආදි විසභාග රූප හෝ ආපාථයට එන්නේ ය. ඇතැම් විට ඒ සිරුර ම විසභාග වන්නේ ය. පුරුෂයා හට ස්ත්‍රී ශරීරය ද ස්ත්‍රීහට පුරුෂ ශරීරය ද විසභාග ය. එය අළුත මළ එකක් නම් ශුභ වශයෙන් වැටහී යාමෙන් බ්‍රහ්ම චරියන්තරාය හෝ වන්නේ ය. “මා වැන්නේකුට මෙය බැරි නොවේ ය” යි ඉදින් තමා සැලකේ නම් එවැන්නක් විසින් විසභාගාරම්මණය කරා ද යා යුතු.

එසේ යන්නහු විසිනුදු සංඝස්ථවිරයන්ට හෝ අන්‍ය ප්‍රසිද්ධ භික්ෂුවකට හෝ දන්වා යා යුතු. ඒ කවර හෙයින් ද යත්? සොහොනෙහි අමනුෂ්‍යයන්ගේ හෝ සිංහ ව්‍යාඝ්‍රාදීන්ගේ හෝ රූප ශබ්දාදි අනිෂ්ටාරම්මණයකින් පීඩිත වූ ඒ යෝගී භික්ෂුහුගේ අඟ පසඟ හෝ වෙවුලා නම්, කෑ අහර හෝ නැඟී ඒ නම්, අන්‍ය ආබාධයෙක් හෝ වේ නම් ඒ සංඝස්ථවිර හෝ අන්‍ය ප්‍රසිද්ධ භික්ෂු හෝ ඔහු සතු විහාරයෙහි පාසිවුරු රැක ගනිති. දහර භික්ෂූන් හෝ සාමණේරයන් හෝ යවා පිළියම් කරවති. තව ද සොහොන් භූමිය නම් නිසැක තැනක් යැයි සිතා සොරකම් කළා වූ ද නොකළා වූ ද සොරු එහි රැස් වෙති. මිනිසුන් විසින් ලුහුබඳනා ලද සොරු භික්ෂු ළඟ බඩු දමා ලා පලා යති. මිනිස්සු බඩු සහිත සොරා දුටුම්හ යි ඔහු අල්ලා ගෙන වෙහෙසන්නාහු නම්, ඒ තෙරහු “මේ මහණහට පීඩා නො කරවු. මේ අපට දන්වා මෙබඳු වැඩක් සඳහා එහි ගියේ ය”යි කියා මිනිසුන් සන්සිඳුවා ඒ භික්ෂුවට සුවයක් ලබා දෙති. දන්වා යාමෙහි මේ ආනිශංස යි.

එබැවින් යට දැක්වුණු සේ භික්ෂු නමකට දන්වා අශුභ නිමිත්තයක් දැකීමෙහි අභිලාෂ ඇත්තහු විසින් අභිෂේක ශාලාවට යන ක්ෂත්‍රියකු සේ යාග ශාලාවට යන යාජකයකු සේ නිධි ස්ථානයට යන දුගියකු සේ ප්‍රීති සොම්නස් උපදවා අටුවාවෙහි කී පරිදි යා යුතු.

අටුවායෙහි මෙසේ දක්වන ලදි.

> “උද්ධුමාතකං අසුභනිමිත්තං උග්ගණ්හන්තො එකො අදුතියො ගච්ඡති උපට්ඨිතාය සතියා අසම්මුට්ඨාය අන්තොගතෙහි ඉන්ද්‍රියෙහි අබහිගතෙන මානසෙන ගතාගතමග්ගං පච්චවෙක්ඛමානො. යස්මිං පදෙසෙ උද්ධුමාතකං අසුභනිමිත්තං නික්ඛිත්තං හොති, තස්මිං පදෙසෙ පාසාණං වා වම්මිකං වා රුක්ඛං වා ගච්ඡං වා ලතං වා සනිමිත්තං කරොති, සාරම්මණං කරොති. සනිමිත්තං කත්වා සාරම්මණං කත්වා උද්ධුමාතකං අසුභනිමිත්තං සභාවභාවතො උපලක්ඛෙති, වණ්ණතොපි ලිඞ්ගතොපි සණ්ඨානතොපි දිසතොපි ඔකාසතොපි පරිච්ඡෙදතොපි සන්ධිතො විවරතො නින්නතො ථලතො සමන්තතො. සො තං නිමිත්තං සුග්ගහිතං කරොති, සූපධාරිතං උපධාරෙති, සුවවත්ථිතං වවත්ථපෙති. සො තං නිමිත්තං සුග්ගහිතං කත්වා සූපධාරිතං උපධාරෙත්වා සුවවත්ථිතං වවත්ථපෙත්වා එකො අදුතියො ගච්ඡති උපට්ඨිතාය සතියා අසම්මුට්ඨාය අන්තොගතෙහි ඉන්ද්‍රියෙහි අබහිගතෙන මානසෙන ගතාගතමග්ගං පච්චවෙක්ඛමානො.

සො චඞ්කමන්තොපි තබ්භාගියඤ්ඤෙව චඞ්කමං අධිට්ඨාති. නිසීදන්තොපි තබ්භාගියඤ්ඤෙව ආසනං පඤ්ඤපෙති.

“සමන්තා නිමිත්තුපලක්ඛණා කිමත්ථියා කිමානිසංසාති? සමන්තා නිමිත්තුපලක්ඛණා අසම්මොහත්ථා අසම්මොහානිසංසා. එකාදසවිධෙන නිමිත්තග්ගාහො කිමත්ථියො කිමානිසංසොති? එකාදසවිධෙන නිමිත්තග්ගාහො උපනිබන්ධනත්ථො උපනිබන්ධනානිසංසො. ගතාගතමග්ගපච්චවෙක්ඛණා කිමත්ථියා කිමානිසංසාති? ගතාගතමග්ගපච්චවෙක්ඛණා වීථිසම්පටිපාදනත්ථා වීථිසම්පටිපාදනානිසංසා.

“සො ආනිසංසදස්සාවී රතනසඤ්ඤී හුත්වා චිත්තීකාරං උපට්ඨපෙත්වා සම්පියායමානො තස්මිං ආරම්මණෙ චිත්තං උපනිබන්ධති ‘අද්ධා ඉමාය පටිපදාය ජරාමරණම්හා පරිමුච්චිස්සාමී’ති. සො විවිච්චෙව කාමෙහි...පෙ... පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. තස්සාධිගතං හොති රූපාවචරං පඨමං ඣානං දිබ්බො ච විහාරො භාවනාමයඤ්ච පුඤ්ඤකිරියවත්ථු”න්ති.

මෙහි සංක්ෂිප්ත අර්ථය මෙසේ ය:-

‘උද්ධුමාතක අසුභ නිමිත්ත උගන්නා යෝගාවචර නො මුළා ව එළඹ සිටි සිහියෙක් යුතුව සංවර වූ ඉන්ද්‍රියයෙන් යුතුව නොම බැහැර ලූ සිතින් යුතුව ගිය - ආ මඟ සලකමින් හුදෙකලා ව යන්නේ ය. ඒ උද්ධුමාතක නිමිත්ත තිබුණු පෙදෙසෙහි පිහිටි ගල හෝ තුඹස හෝ රුක හෝ පඳුර හෝ වැල හෝ සනිමිත්ත කරන්නේ ය. සාරම්මණ කරන්නේ ය. සනිමිත්ත කොට සාරම්මණ කොට ඒ අසුභ නිමිත්ත සහාග හෙයින් සලකුණු කරන්නේ ය. හෙතෙම ඒ අශුභ නිමිත්ත වර්ණ වශයෙන්, ලිඞ්ග වශයෙන්, සණ්ඨාන (සටහන්) වශයෙන්, දිසා වශයෙන්, ඔකාස (අවකාශ) වශයෙන්, පරිච්ඡේද වශයෙන්, සන්ධි වශයෙන්, විවර (සිදුරු) වශයෙන්, නින්න (නිම්නස්ථාන) වශයෙන්, ථල (උස්තැන්) වශයෙන්, සමන්ත (හාත්පස) වශයෙන් යන ආකාරයෙන් සුග්ගහීත (මනාකොට ගන්නා ලද්දේ) කරයි. සූපධාරිත (මනා වූ පරීක්ෂාවෙන්) පරීක්ෂා කරයි. සුවවත්ථිත (මනා වූ නිශ්චයෙන්) නිශ්චය කරයි. එසේ සුග්ගහීත-සූපධාරිත-සුවවත්ථිත කොට නො මුළා ව, එළඹ සිටි සිහියෙන් යුතුව, සංවර වූ ඉන්ද්‍රියයෙන් යුතුව, බැහැර නො වූ සිතින් යුතුව, ආ ගිය මඟ සලකමින් හුදෙකලා ව දෙවැන්නෙක් නොමැතිව යන්නේ ය. හෙතෙම සක්මන් කරන්නේ ද ඒ අසුභ නිමිත්ත මනස්කාර සහිතව ම සක්මන් කරන්නේ ය. හිඳින්නේ ද ඒ මනස්කාර සහිතව ම හිඳින්නේ ය.

උද්ධුමාතකයට හාත්පස පාෂාණාදි නිමිති සලකුණු කිරීම කවර අර්ථයක් ඇත්තී ද? කිනම් ආනිශංසයක් පිණිස ද යත්? අසමේමාහ පිණිස ය. එනම් උද්ග්‍රහ නිමිත්ත එළඹ සිටි කල්හි උපදනා මුළා බව දුරු කිරීම පිණිස වේ. එම නොමුළා බව ම ආනිශංස කොට ඇත්තී වේ. එකොළොස් ආකාරයෙන් නිමිති සලකුණු කිරීම කවර අර්ථයක් ඇත්තී ද, කිනම් ආනිශංසයක් පිණිස ද යත්? අශුභාරම්මණයෙහි සිත එළවා බැඳීම පිණිස වේ. ඒ ආනිශංස පිණිස වේ. ආ ගිය මඟ සැලකීම කවර අර්ථයක් පිණිස ද?

කවර ආනිශංසයක් පිණිස ද යත්? කර්මස්ථාන වීථියට මනා කොට පිළිපැදීම පිණිස ය. එම ආනිසංස පිණිස ය.

ඒ යෝගාවචර තෙම ආනිශංස දකිමින් රත්න සංඥා ඇතිව, ගෞරව උපදවා, ප්‍රිය කරමින් "ඒකාන්තයෙන් මම මේ ප්‍රතිපදායෙන් ජරා මරණයෙන් මිදී ගන්නෙමි"යි ඒ අරමුණෙහි සිත බැඳලන්නේ ය. හෙතෙම වස්තුකාම ක්ලේශකාමයෙන් වෙන් ව -පෙ- ප්‍රථම ධ්‍යානය ලබා ගෙන වාසය කරන්නේ ය. ඔහු විසින් මෙසේ රූපාවචර ප්‍රථම ධ්‍යානය ද, දිව්‍ය වූ ආර්ය විහරණය ද, භාවනාමය පුණ්‍ය ක්‍රියා වස්තුව ද ලබා ගන්නා ලද්දේ වෙයි."

එහෙයින් යමෙක් තමාගේ අසංයත වූ සිත දමනය කර ගැන්ම සඳහා මළ සිරුරු දක්නට යන්නේ නම් හෙතෙම ගෙඩිය ගසා ගණයා රැස් කරවා ගෙන ද යන්නේ වේවා. කර්මස්ථාන ප්‍රධාන කොට යන්නහු විසින් එසේ නො කොට දෙවැන්නකු හෝ නො ගෙන එකලා ව මූල කර්මස්ථානය සිතින් නො හැර එම සිහි කරමින් සොහොනෙහි සුනඛාදීන්ගෙන් වන උපද්‍රව වළකනු සඳහා සැරයටිය හෝ අන්කිසි යෂ්ටියක් හෝ ගෙන මූල කර්මස්ථානය මෙනෙහි කිරීමෙන් නුමුළා සිහි ඇති ව චක්ෂුරාදි ඉන්ද්‍රියයන් මනා ව සංවර කොට ගෙන බැහැර නො ගිය සිහි ඇති ව ගමන් කළ යුතු.

විහාරයෙන් නික්මෙත් ම අසවල් දිග අසවල් දොරින් නික්මුණෙමි යි ද්වාරය සිහියේ තබා ගත යුතු. ඉක්බිති යම් මඟකින් යන්නේ නම් ඒ මඟ "මෙය නැගෙනහිරට අභිමුඛ ව ගියේ ය, මෙය බස්නාහිරට අභිමුඛ ව ගියේ ය, මෙය උතුරු දිගට - මෙයට දකුණු දිගට - මෙය සතර අනු දිගට අභිමුඛ ව ගියේ ය යි ව්‍යවස්ථා කර ගත යුතු. තව ද මෙතැන දී වමට ගියේ ය, මෙතැන දී දකුණට ගියේ ය, මෙ තැන ගල ය, මෙ තැන තුඹස ය, මෙ තැන රුක ය, මෙ තැන ගස ය, මෙ තැන වැල යයි මෙසේ ගමන් මඟ ව්‍යවස්ථා කර ගනිමින් නිමිත්ත ස්ථානයට යා යුතු ය. එසේ යන්නේ ද උඩු සුළඟට නො යා යුතු. කුමක් හෙයින් ද උඩු සුළඟට යත් ම කුණු ගඳ නැහැයේ වැදී හිස් මුල් හෝ අලළන්නේ ය. ආහාර හෝ නංවන්නේ ය. 'මෙබඳු කුණප ස්ථානයකට ආයෙමි' යි විපිළිසර හෝ දනවන්නේ ය. එබැවින් උඩු සුළඟ හැර යටි සුළඟට යා යුතු අතර ප්‍රපාතයෙක් හෝ පර්වතයෙක් හෝ පහණෙක් හෝ වැටෙක් හෝ කටුලැහැබෙක් හෝ දියකඩෙක් හෝ මඩ බිමෙක් හෝ වේ නම් එයින් උඩු සුළඟට යා නො හැකි නම් සිවුරු කනින් නැහැය වසා ගෙනැ යා යුතු. මේ ඒ යෝගී හට ගමන් වත යි.

එසේ ගියහු විසින් තව අශුභ නිමිත්ත නො බලා දිශා ව්‍යවස්ථා කර ගත යුතු. ඇතැම් දිශාභාගයෙක සිටියහුට අරමුණ විභූත ව නො වැටහෙයි. සිත ද භාවනාවට යෝග්‍ය නො වෙයි. එබඳු දිශාභාග හැරපියා අරමුණ විභූත ව වැටහෙන සිත ද භාවනාවට යෝග්‍ය වන දිශාභාගයෙක සිටිය යුතු. එසේ ම වාතයට මුහුණ ලා ද පිටු පා ද නො සිටිය යුතු. වාතයට මුහුණ ලා සිටුත් ම කුණු ගඳින් පෙළීමෙන් සිත වික්ෂිප්ත වෙයි. වාතයට පිටුපා සිටුත් හොත් කුණපයට අධිගෘහිත අමනුෂ්‍යයෝ වූ නම් ඔහු කිපී අනර්ථ කරති. එබැවින් මඳක් අයින් ව ඉතා අනුවාතයෙහි නො සිටිය යුතු. එසේ සිටින්නහු විසිනුදු ඉතා දුරව ද ඉතා ළංව ද නො සිටිය

යුතු. පා ළඟ හෝ හිස ළඟ හෝ නො සිටිය යුතු. කුමක් හෙයින් ද ඉතා දුර ව සිටින කල්හි අරමුණ විභූත නො වේ. ඉතා ළංව සිටින කල්හි බිය උපදී. පාළඟ හෝ ඉස ළඟ හෝ සිටි කල්හි අසුභය මුළුල්ල නො පෙනෙයි. එබැවින් ඉතා දුරත් නොව ඉතා ළඟත් නොව පහසුයෙන් බැලිය හැකි මැද හරියේ සිටිය යුතු. එසේ සිට “තස්මිං පදෙසෙ පාසාණං වා -පෙ- ලතං වා සනිමිත්තං කරොති” යි අටුවායෙහි කී පරිදි නිමිති සැලකිය යුතු.